www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# යුද්ධයට මුදල් යෙදවීම සඳහා ශ්‍රී ලංකා රජය නව බදු පනවයි

## Sri Lankan government imposes new taxes to fund war

**සමන් ගුනදාස විසිනි**
**2007 සැප්තැම්බර් 19**

යලි පනගන්වන ලද යුද්ධයට මුදල් සපයාගැනීමේ මංමුලාසහගත උත්සාහයේදී, භාන්ඩ සහ සේවා රැසක් මත බදු වැඩි කරමින් සැප්. 6 වනදා, ශ්‍රී ලංකා රජය මුදල් පනත් පහක් පාර්ලිමේන්තුව තුල සම්මත කලේය. නොවැම්බර් මුල 2008 අයවැය නියමිතව තිබියදී ඉදිරිපත් කෙරුනු මෙම පනත්, රු. බිලියන 10 කට ආසන්න (එ.ජ. ඩො. මිලියන 88) මුදලක් උපයාගැනීමත් ආන්ඩුවේ මුදල් හිගයට ඇබ ගැසීමත් එල්ල කර දියත් කරන ලද වැඩ සටහනක් විය.

සෙලියුලර් දුරකථන මත සියයට 2.5 සිට 10 ක බදු වැඩි කිරීමක්ද, විශාල රථවාහන සඳහා සියයට 2.5 සිට 5 දක්වා ආනයන බදු වැඩි කිරීමක්ද, ආනයනික භාන්ඩ මත සියයට 10 සිට 15 තෙක් බදු වැඩිවීමක්ද, සහ දේශීය නිෂ්පාදන භාන්ඩ සඳහා සියයට 10 සිට 15 තෙක් නිෂ්පාදන බදු වැඩිවීමක්ද, මෙම නව පැනවීම් වලට අයිතිය. මේවා අතරින් ආනයන බදු හා නිෂ්පාදන බදු බොහෝ භාන්ඩ සඳහා අදාල වන බැවින්, දැනටමත් තියුනු ලෙස වැඩිවන මිල ගනන් තව දුරටත් ඉහල යනු ඇත.

පාර්ලිමේන්තු විවාදයේදී නියෝජ්‍ය මුදල් අමාත්‍ය රන්ජිත් සියඹලාපිටිය පනත් යුක්තිසහගත කරමින් ප්‍රකාශ කලේ, "ජාතික ආරක්ෂාව සුරක්ෂිත කිරීම හා ජනතාවට සහනාධාර සැපයීම ඇතුලත්ව, ආන්ඩුවේ අනෙකුත් වගකීම් සලකා බැලීමේදී එවැනි බදු පැනවීම් අවශ්‍ය බවය." රජය විසින් සහනාධාර කපා හරිමින් සිටින තතු තුල මෙම මුදල්, "සහනාධාර සැපයීම්" සඳහා නොව්, දෙමල ඊලාම් විමුක්ති කොටි සංවිධානයට එරෙහි වර්ගවාදී යුද්ධයට යෙදවීමටය.

2002 සටන් විරාමය විවතවම උල්ලංඝනය කරමින්, දිවයිනේ නැගෙනහිර පලාතේ එල්ටීටීඊ බලප්‍රදේශ යටත් කරගැනීමට 2007 ජූලි මාසයේදී මිලිටරි ආක්‍රමන පෙලක් දියත් කිරීමත් සමගම ආරක්ෂක වියදම් තියුනු ලෙස ඉහල ගියේය. ආරක්ෂක සහ මුදල් ඇමති තනතුරුද හොබවන ජනාධිපති මහින්ද රාජපක්ෂ, 2006 හා සංසන්දනය කරන විට, ආරක්ෂක වියදම් සියයට 45 කින් එනම් රු. බිලියන 139 කට ඉහල දැම්මේය. අයවැය ප්‍රකාශයට පත් කල පසු මිලිටරි වියදම් එක දිගටම ඉහල ගියේය.

නැගෙනහිර "ජයග්‍රහනය" ප්‍රකාශයට පත්කරමින්, එල්ටීටීඊ උතුරු බලකොටුවලට නව ප්‍රහාරයක් දියත්කිරීමට රාජපක්ෂ ආන්ඩුව අර අඳිමින් සිටී. ජීවන වියදම ඉහල යෑමට එල්ලවන මහජන විරෝධය හෝ වියදම මත පිහිටා යුධ මෙහෙයුම් නොනවත්වන බව ජනාධිපතිත්, ඔහුගේ සොහොයුරු, ආරක්ෂක ලේකම් ගෝඨාභය රාජපක්ෂ පැහැදිලිවම ප්‍රකාශ කර තිබේ. ගිය වසර පුරාම, නඩත්තුකිරීම හා මෙහෙයවීම ඉතා වියදම් අධිකවන ගුවන් ප්‍රහාර, යුද්ධායුධ, සහ මල්ටි බැරල් රොකට් විදිනයන් යුධ හමුදාව විසින්, අධික ලෙස භාවිතා කරන ලදී.

ඡන්දදායකයන් මත අලුත් බර පැටවීම් ගැන එක්සත් ජාතික පක්ෂය සහ ජනතා විමුක්ති පෙරමුන ආන්ඩුවට කෝපසහගතව ප්‍රසිද්ධියේ චෝදනා කිරීමත් සමග බදු පනත්, පාර්ලිමේන්තුවේ කමකට නැති විවාදයක් පැන නැංගුවේය. ඡන්ද විමසීමට ඉලෙක්ට්‍රොනික් යන්ත්‍රය භාවිතා කිරීමට විරෝධය පලකල විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ අත් එසවීමෙන් ඡන්දය ගන්නැයි ඉල්ලා සිටියේය. එජාප මන්ත්‍රීවරයෙක් කතානායකගෙන් ලියකියවිලි උදුරා ගැනීමට උත්සාහ කිරීම සභා ගර්භයේ පොරයකට මුල පිරීය. විරුද්ධ පක්ෂ මන්ත්‍රීවරු තම සෙලියුලර් දුරකතන ඔසවමින් ඔවුහු "බදුවලට විරුද්ධ" බව ප්‍රකාශ කලෝය. ගාලගෝට්ටිය මධ්‍යයේ, එජාපය එල්ටීටීඊ පක්ෂපාත දෙමල ජාතික සංධානය හා ජවිපෙ සමග එක්ව විපක්ෂව ඡන්දය දීමත් සමග පනත් 106 ට 81 ක් ලෙස සම්මත විය.

මෙම දේශපාලන අභිරූපනය, එජාපයට හෝ ජවිපෙට මෙම පනත්වලට කිසිඳු ප්‍රතිපත්තිමය විරුද්ධත්වයක් නොමැත යන කාරනාව සගවන්නට කල සැලසුමකි. යුද්ධය සහ එහි බර පැටවීම්, ඉතා ගැඹුරු ලෙස මහජන අප්‍රසාදයට පත්ව ඇති බව ඔවුන් හොඳින්ම දන්නා බැවින්, ඔවුන්ගේ රගපෑම මහ

ජනතාවගේ අවධානය සඳහා පමනි. කෙසේවුවත්, එජාපය හෝ ජවිපෙ එල්ටීටීඊයට එරෙහි අලුත්ම ප්‍රහාරවලට සහාය දක්වන අතර මෙම මුදල් යොදවන ප්‍රතිගාමී අරමුනුවලට විරුද්ධ වූයේ නැත.

ජවිපෙ පිලිබඳව සලකා බැලූ කල එහි විරුද්ධත්වය විශේෂිතවම දෙබිඩි ස්වරූපයක් ගනී. යුද්ධය උත්සන්න කිරීමේ තම ඉල්ලීමේ තර්කය, අඩු නොව, වැඩි බදු සඳහාය. තම ආදර්ශ පාඨය වන "පලමුව මව්බිම අන් සියලු දේ පසුවට" යන්නෙහි තේරුම යුද්ධය සඳහා වැඩකරන ජනතාව කැපකිරීම් කල යුතුමය යන්නයි. ප්‍රධාන ඡන්ද විමසීම් වලදී ජවිපෙ ආන්ඩුවට දිගටම සහයෝගය දෙයි. ඒ සමගම එය වැඩකරන ජනතාවගේ සහ ගම්බද දුගීන්ගේ ආරක්‍ෂනයා ලෙස පෙනී සිටීමටද උත්සාහ දරයි. පාර්ලිමේන්තු ගාලගෝට්ටිය මධ්‍යයේදී, ජවිපෙ මන්ත්‍රීවරු යුද්ධය සම්බන්ධව සම්පූර්නයෙන්ම මුනිවත රැකීම එනයින් පුදුමයක් නොවේ.

එජාපය පිලිබඳව සැලකූ කල, ඡන්ද විමසීම "නීත්‍යානුකූල නොවන" බවට වූ ඔවුන් කල චෝදනාව, පසුව නිශ්ශබ්දවම අත්හලේය. රාජපක්‍ෂ ආන්ඩුව සමග එජාපයේ පවතින වෙනස පැහැදිලිවම උපායාත්මකය. එහි ස්ථාවරය, යුද්ධය ආර්ථිකයට බලපෑම් එල්ලකරන අතර එය මිලිටරිමය ව්‍යසනයකින් කෙලවර විය හැකිය යන ව්‍යාපාර කොටස්වල සැලකිල්ල ප්‍රතිබිම්බනය කරයි. නමුත්, 1983 දී එල්ටීටීඊයට එරෙහිව යුද්ධය දියත් කල එජාපය, නව මිලිටරි ආක්‍රමනවලට විරුද්ධ නොවේ.

රජය පැහැදිලිවම මූල්‍ය අර්බුදයක සිරවී සිටී. මධ්‍යම රජයෙන් ලැබෙන මුදල් සියයට 60 කින් කප්පාදු කර ඇති බව ජූනි මාසයේදී පලාත් සභා ප්‍රධාන ඇමතිවරුන්ගේ රැස්වීමක් චෝදනා කලේය. මේ වසරේ මහජන ආයෝජනය සඳහා අයවැයෙන් වෙන්කල මුදලින් රු. බිලියන 65 ක් හෝ සියයට 25ක් රජය කපාහැර තිබෙන බව, ව්‍යාපාරික වෙබ් අඩවියක් වන, මනි රිපෝට් එළිදරව් කලේය.

ජාත්‍යන්තර මුදල් වෙලඳපොලින් ඩොලර් මිලියන 500 ක් රැස් කරගැන්මට කල සැලසුම තවත් මතභේදයකට තුඩු දුන්නේය. බැඳුම්කර නිකුතුව දියත් කිරීමට බාක්ලේස් කැපිටල්, හොංකොං ඇන්ඩ් ෂැංහයි, සහ ජේපී ස්ටැන්ලි මෝර්ගන් යන ප්‍රධාන බැංකු හවුලක් පත් කරගෙන තිබේ. නය ලබාගැනීමේ කාරනාව සම්බන්ධව රජය සෘජු පිලිතුරක් ලබා නොදේ. මුලින්ම, මෙම මුදල් යොදවන්නේ සංවර්ධන හා යටිතල පහසුකම් ව්‍යාපෘති සඳහා යැයි ප්‍රකාශ කල නමුදු, ඒවා විශේෂිතව හඳුන්වන්නට අසමත් විය.

නය "යටිතල පහසුකම්" සඳහාය යන ආන්ඩුවේ ප්‍රකාශය ප්‍රශ්නයට බඳුන් කරන පසුගිය සති අන්ත සන්ඩේ ටයිම්ස් පුවත්පත, එහි නියම අභිප්‍රාය මෙසේ පෙන්වා දුන්නේය." ඉතාම නරක තත්වය වන්නේ මෙය ආර්ථික වශයෙන් පලදායී නොවන මිලිටරි වියදම් සඳහා යෙදවීමයි. මේ මුදල් මිලිටරි උපකරන ආනයනය සඳහා යොදාගන්නා ප්‍රමානයට. ආනයන සඳහා පිටතට මුදල් ගලායන බැවින්, මුදල් ගලා ඒම තුලින් ගෙවුම් ශේෂයට ඇතිවන හදිසි ප්‍රතිලාභය පවා, ඉක්මනින් හිලව් වනු ඇත. මේවා දේශීය යුද වියදම් සඳහා යොදාගන්නා ප්‍රමානයටම, ආර්ථිකය උද්ධමනකාරී වනු ඇත."

විවිධ වෙස් ගැන්වීම් තිබියදීත්, එක් ආකාරයකට හෝ වෙනත් ආකාරයකට, නය යුද්ධය සඳහාම යොදවනු ඇත. ලබාගන්නා නය මුදල් වියදම් කරනු ලබන ආකාරය සම්බන්ධයෙන් තහංචි නොපනවන නිසා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වැනි ආයතන වලින් සංවර්ධන නය ලබා ගන්නවාට වඩා, වානිජ පොලී අනුපාත යටතේ නය ලබා ගැනීමට ආන්ඩුව සූදානම්ය. මෙම මුදල ප්‍රමානාත්මකව විශාල ලෙස නොපෙනුනද, පසුගිය ජුනි මස වනවිටත් රුපියල් බිලියන 1014 ක් වූ ( ඇ. ඩොලර් බිලියන 895 ක්) විදේශ නය සලකා බැලූ විට මෙම මුදල සැලකිය යුතු එකතුවකි. එක්සත් ජනපදය තුල සිදුවූ උකස් නය අර්බුදය හේතුවෙන් හට ගැනුනු ජාත්‍යන්තර මූල්‍ය ආරවුල නිසා බැඳුම්කර නිකුතුව ප්‍රමාද විය.

දැනටමත් මිල ගනන් තියුනු ලෙස ඉහල යමින් පවතී. බදු වැඩි කල සතිය තුලදීම රජය ෂෙල් ගෑස් සමාගමට තම මිල ගනන් සියයට 20 කින් ඉහළ දැමීමට අවසර දෙන ලදි. මෙය, මෙම වසර තුළදී ගෑස් මිළ ඉහල දැමූ තෙවන අවස්ථාවයි. ජාත්‍යන්තර වෙලඳපල මිල උච්චාවචනයන්ට අනුකූලව දේශීය වෙලඳපලේ ගෑස් මිල වෙනස් කිරීමට අවසර දීමට රජය පසුගිය මසදී මෙම සමාගම සමග එකඟ විය. සැප්තැම්බර් 11 වන දින පාරිභෝගික කටයුතු පිලිබඳ අමාත්‍ය බන්දුල ගුනවර්ධන ප්‍රකාශ කර සිටියේ, රජය කිරි පිටි මිල සියයට 28 - 39 අතර ප්‍රමානයකින් ඉහල දැමීම සඳහා අවසර ලබාදෙන බවයි. මෙයද කිරි පිටි සඳහා මෙම වසර තුලදී මිල ඉහල දමන තෙවන අවස්ථාවයි.

අගෝස්තු මසදී, උද්ධමන අනුපාතිකය සියයට 17.3ක් වූ අතර එය ජූලි මස අගය වූ සියයට 17.6 ට වඩා සියුම් අඩුවීමක් වුවද, මහ බැංකුව විසින් පෙරොන්දුවූ එක් ඉලක්කමේ උද්ධමන අනුපාතිකයට වඩා ඉතා ඉහළ අගයකි. අනෙකුත් විදේශ මුදල් වලට සාපේක්ෂව, ඩොලරයේ අගය පහල ගියද රුපියලේ අගය තවදුරටත් ඩොලරයට සාපේක්ෂව පහළ යමින් පවතී. ජනවාරි මසදී, රුපියල් 106 ක් වූ ඩොලරයේ අගය, සැප්තැම්බර් මස වනවිට 113 දක්වා ඉහල ගොස් ඇත.

ඉහල යන උද්ධමනය පාලනය කිරීමේ පියවරක් ලෙස මහ බැංකුව සිය සංකේතාත්මක පොලී අනුපාතිකය, පසුගිය වසර 5 තුළ ඉහළම අගය වූ සියයට 10.5ක අගයක පිහිටුවා ඇත. වානිජ බැංකු පොලී අනුපාතිකයන් සියයට 17.5 ක් දක්වා ඉහල ගොස් ඇත. කෙසේවුවත්, මෙම නය සීමාකිරීම, උද්ධමනය පාලනය කිරීමට අසමත්ව ඇති අතර එමගින් සිදුව ඇත්තේ ආර්ථික වර්ධනය අඩු වීම පමනි. *බ්ලුම්බර්ග් නිව්ස් සර්වේ* සැප්තැම්බර් මස 12 දින වාර්තා කලේ, දෙවන කාර්තුව සඳහා ආර්ථික වර්ධන වේගය සියයට 6.1ක් වන බවයි. එය, පසුගිය දෙවසර තුළ අඩුම අගය වූ, මෙම වසරේ පළමු කාර්තුවේ වර්ධන වේගයට සමානය.

මිළ ඉහල දැමීම සම්බන්ධයෙන් තමන් කළ ප්‍රකාශය ආරක්ෂාකරමින්, පාරිභෝගික කටයුතු පිලිබඳ අමාත්‍ය බන්දුල ගුනවර්ධන ආන්ඩුවේ ආර්ථික ප්‍රතිපත්තිය විස්තර කරමින් ඍජුවම ප්‍රකාශ කලේ, "ආරක්ෂක වැය ශීර්ෂය රුපියල් බිලියන 140 ක්. අප උණ්ඩ හා ෂෙල් ආනයනය කල යුතුයි. අපිට ප්‍රභාකරන්ට කැටපෝල වලින් පහර දෙන්න පුළුවන්නම්, අපි විදේශ විනිමය වැය කරන්න ඕන නෑ." භාණ්ඩ මිළ පාලනය කිරීම සම්බන්ධයෙන් රජය පෙර ලබාදුන් පොරොන්දු පිලිබඳව වාර්තාකරුවන් නැගූ ප්‍රශ්නයන් ඉවතලමින් අමාත්‍යවරයා ප්‍රකාශකර සිටියේ, ඒවා "දේශපාලන සටන්පාඨ" පමණක් බවයි.

මෙම නව බදු හා ඉහල යන මිල ගනන් පැහැදිලිවම, රජය තම යුද්ධයේ බර වැඩකරන ජනතාව මත පැටවීමට යොදාගන්නා උපක්‍රම වේ.

© www.wsws.org